ඉන්දියාවේ මහජන යුද්ධයට සහය දීමේ ජාත්‍යන්තර කමිටුව ජුලි 1 වන දින සහයෝගිතා දිනයක් දියත් කොට ඇති අතර බොහෝ රටවල එය පැවැත්වේ.

ඉතාලියේ මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය (PCm) මෙම කමිටුව ඉදිකිරීමට සහ 2012 නොවැම්බර් 24 වන දින හැම්බර්ග් හි පැවැත් වූ ජාත්‍යන්තර සම්මේලනය පැවැත්වීම වෙනුවෙන් තිරණාත්මක දයකත්වයක් සපයා ඇති අතර, සියළුම කොමියුනිස්ට්වරුන්ට, විප්ලවවාදීන්ට, අධිරාජ්‍යවිරෝධීන්ට, නිර්ධන පංති අරගල සංවිධානයන්ට මේ දිනයෙහි කොටස්කරුවන් වීමට ආමන්ත්‍රණය කරයි.

ඉන්දියාව තුළ ඓතිහාසික සටන යුධ වදින්නේ ඉන්දියාවේ නිර්ධනීන් සහ ජනතාව සඳහා පමණක් නොව ගෝලීය මට්ටමින් ධනේශ්වරය සහ නිර්ධන පංතිය අතර, අධිරාජ්‍යවාදය සහ විප්ලවය අතර බලය තුලනය කිරීමටයි. ඉන්දියාවේ මහජන යුද්ධය සංඛ්‍යාත්මකව ගත්කළ සටන්කරුවන් අතින්, ගරිල්ලා කලාපවල පුළුල් බව අතින් සහ රාජ්‍ය බලය සහ ජනතා බලය අතර අරගලයට සම්බන්ධවී සිටින ජනතාව අතින් එය ලෝකයේ අද දින විශාලතම අධිරාජ්‍ය විරෝධී සහ විමුක්ති අරගලයයි.

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) සාමාජිකයින්ගේ සහ සටන්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ලෝකයේ තිබෙන ශක්තිමත්ම කොමියුනිස්ට් පක්ෂයයි.

අයෙකු මාඕවාදියෙකු වුවද නොවූවද කිසිවිටක සත්‍යයෙනක් බැහැර විය නොහැක.

මහජන යුද්ධයට පක්ෂව නැගී නොසිටින්නේ කවරෙක්ද, ඔවුහු අධිරාජ්‍යවාදයට, සංශෝධනවාදයට සහ අවස්ථාවාදයට පක්ෂව නැගී සිටී.

නිර්ධන පංති ජාත්‍යන්තරවාදය උදෙසා,
නිර්ධන පංතියේ ජයග්‍රහණය උදෙසා,
ජුලි 1 වැනි දින ගත හැකි සෑම පියවරක්ම ගනිමු!

ඉතාලියේ මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය (PCm)
ජුනි 17